**සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය - 2019**
**--------------------------------------**

**1.1 මතය**
**-------**

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**
**---------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි.

මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**
**------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්විද්‍යාලයයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන සේවක ණය හා අත්තිකාරම් ශේෂය තුළ ඇතුළත් නිලධාරීන් 7 දෙනෙකුගේ අය නොවන එකතුව රු. 980,433 ක්වූ ආපදා, වාහන, සේවක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන වල අනිකුත් ගෙවිය යුතු ශේෂ යටතේ දක්වා ඇති 2017 වර්ෂයට අදාළ එකතුව රු.156,385 ක්වූ නොගෙවූ ගෙවීම් ශේෂ 90ක් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු නොකර ජංගම වගකීම් යටතේ පෙන්වා තිබුණි. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | ඉක්මනින් නිරවුල් කළ යුතුය. |

**1.6.3 අත්තිකාරම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූලා ප්‍රකාශන තුළ ඇතුළත් එකතුව රු.5,319,506 ක් වූ මූලධන අත්තිකාරම් ශේෂ 2 ක් දීර්ඝ කාලයක සිට නිරවුල් කර නොතිබුණි. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | ඉක්මනින් නිරවුල් කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 571 | විවිධ කාර්යයන් සඳහා 2011 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලය තුළ අවස්ථා 73 ක දී විශ්වවිද්‍යාලයේ තැන්පත්කළ එකතුව රු.45,898,995 ක් වූ තැන්පතු හා රඳවා ගැනීම් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 770(2) | 2019 වර්ෂය තුළදී සිදු කරන ලද වාර්ෂික ගබඩා තොග භෞතික සමීක්ෂණ වාර්තාව අනුව එකතුව රු. 1,444,532ක් වූ පුනරාවර්තන අයිතම 20ක් 2016 වර්ෂයට පෙර සිට භාවිතයට ගැනීමකින් තොරව ගබඩාව තුළ පවතින බව නිරීක්ෂණය විය. | කමිටුවේ නිර්දේශ පරිදි කටයුතු කරමින් පවති. | කමිටුවේ නිර්දේශ පරිදි කටයුතු කළ යුතුය. |
| (ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන සංග්‍රහය | | | |
| (i) xxii පරිච්ඡේදයේ 2.2.4 වන වගන්තිය | අනිසි පෞද්ගලික ලාභයක් ලබාගැනීමේ අරමුණ ඇතිව ක්‍රියාකිරීම, තම ඥාතීන්ගේ ලාභ ප්‍රයෝජන තකා එම නිල | මූලික විමර්ශණයක් පවත්වා ඇත. | තම රාජකාරි වලින් ලද බලය අයුතු ලෙස භාවිතා කිරීමට ඉඩ නොතැබිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තත්ත්වය පාවිච්චි කිරීම හා තමාගේ රාජකාරී කටයුතු හෝ බලය යෙදවීම කළ නොහැකි වුවද විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කටයුතු සඳහා ලියාපදිංචිවී ඇති සිසුන් දෙදෙනෙකුගේ ඥාතීන් විශ්වවිද්‍යාලයේ සංගීත පීඨයේ අධ්‍යයන කාර්යමණ්ඩලයේ සේවයේ යෙදෙමින් ඔවුන්ගේ විභාග කටයුතු හා ප්‍රායෝගික පරීක්ෂණ කටයුතු සඳහා සක්‍රීය ලෙස දායකවී ඇති බව විගණනයට නිරීක්ෂණය විය. | | |
| (ii) III පරිච්ඡේදය 26.13 වගන්තිය | විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යනු ලබන පැමිණීමේ ලේඛනයක බාහිර කථිකාචාර්යවරු විසින් පැමිණීම සහතික කරමින් නම, අත්සන සමඟ විෂය සහ දේශන පැය ගණන ආදී අවශ්‍ය විස්තර එහි සඳහන් කළ යුතු වුවද බටහිර සංගීත අධ්‍යයනාංශය විසින් පවත්වාගෙන යනු ලබන ලේඛනය එපරිදි නඩත්තු කර නොතිබුණි. එමෙන්ම එහි තබා ඇති අත්සන් කපාදමා විකෘති කර තිබුණු අවස්ථා විගණනයට නිරීක්ෂණය විය. | විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට තීරණය කර ඇත. | ලේඛන විධිමත් පරිදි පවත්වා ගත යුතුය. |
| (ඇ)1997 නොවැම්බර් 21 දිනැති අංක 721 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | නර්තන හා නාට්‍ය කලා පීඨයේ ආධුනික කථිකාචාර්යවරයකුගේ පරිවාස කාලය එක් වසරකට සීමාකර සේවය ස්ථිර කර තිබුණි. | වැඩිපුර ගෙවූ වැටුප් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛවලට අනුගතව කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.106,865,169 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 34,126,036 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.72,739,133 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පුනරාවර්තන ප්‍රාග්ධන ප්‍රදාන වැඩිවීමට සාපේක්ෂව පුද්ගලික පඩිනඩි වැඩි වීම හා පාරිතෝෂික වෙන්කිරීම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2016 වර්ෂයේදී නාට්‍ය, මුද්‍රා නාට්‍ය සහ නව නර්තන අධ්‍යානාංශයේ පැවති විෂය සමගාමී පරිගණක යෙදවුම් විෂය සඳහා වූ ප්‍රායෝගික පරීක්ෂණයට සහභාගී නොවූ ශිෂ්‍යාවකට පරීක්ෂණ මණ්ඩලය විසින් සහභාගී වූ ලෙස සඳහන් කර ලකුණු ලබාදී විභාග අක්‍රමිකතාවයක් සිදුකර තිබූ අතර 2019 වර්ෂයේදී ඇයව ආධුනික කථිකාචාර්යවරියක ලෙස මෙම පීඨයටම බඳවාගෙන තිබුණි. | මූලික පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කර ඇත. | විභාග අක්‍රමිකතාවයන් පිළිබඳ විධිමත් පරීක්ෂණයක් පවත්වා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්යමණ්ඩලය විසින් විදේශ ශිෂ්‍යත්ව සඳහා යාමේදී එළඹ තිබුණු ගිවිසුම් කඩකළ නිලධාරී 2 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 5,663,792 ක බැඳුම්කර මුදල වසර 4 සිට වසර 8 ක කාලයක සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරන බව සඳහන් කර ඇත. | කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) වටිනාකම රු.1,022,650,000 ක් වූ ඉඩම් 03 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම නීත්‍යානුකූලව පවරා ගැනීමට කළමනාකරණය අපොහොසත් වී තිබුණි. | ඉදිරියේදී ගිණුම් ප්‍රකාශනවල හෙළිදරව් කරන බව සඳහන් කර ඇත. | කඩිනමින් ඉඩම් අත්පත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද Quality Assurance Frame Work හි නිර්දේශිත අවම පැය ගණන් ආචාර්යවරුන් සඳහා වෙන්කළ යුතු වුවද 2016/2017 අධ්‍යයන වර්ෂය සඳහා පැය 796 ක් අඩුවෙන් වෙන්කර තිබූ අතර ආචාර්යවරුන් වෙත වෙන්කරන ලද දේශන පැය ප්‍රමාණයෙන් පැය 2,859.5 ක් ආවරණය කර නොතිබුණි. | ආචාර්යවරුන්ට Quality Assurance Frame Work අනුව දේශන පැය වෙන්කිරීම අනිවාර්ය කර ඇති අතර ආචාර්යවරුන්ට නියමිත පැය ගණන ආවරණය කිරීමට උපදෙස් දී ඇත. | විෂය මාලාව අනුව ඉගැන්වීමට නියමිත සම්පූර්ණ දේශන හා ප්‍රායෝගික පැය ප්‍රමාණයම අධ්‍යයන කාර්යමණ්ඩලය අතරේ බෙදා වෙන් කළ යුතුය. ආචාර්යවරු විසින් තමන්ට නියමිත දේශන පැය ගණන ආවරණය කළ යුතුය. |
| (ii) විභාග අංශයේ කාර්ය පටිපාටියෙහි (By Law) ලිඛිත/ප්‍රායෝගික විභාග පැවැත්වීම පිළිබඳ අංක 20 දරණ අතුරු ව්‍යවස්ථාවෙහි 6.1 වන කරුණට අනුව නියමිත දින පරීක්ෂණය අවසානයේ ප්‍රධාන පරීක්ෂක විසින් අවසාන ලකුණු ලේඛනය සකස් කළ යුතු වුවත් නාට්‍ය, මුද්‍රා නාට්‍ය හා නූතන නර්තන අධ්‍යයන අංශයේ 2016/2017 අධ්‍යයන වර්ෂයේ ප්‍රායෝගික පරීක්ෂණවලට අදාළ ප්‍රතිඵල ලේඛන විභාග අංශයට භාරදීමේදී දින 01 සිට දින 367 දක්වා ප්‍රමාද වූ අවස්ථා 16ක් නිරීක්ෂණය විය. | මූලික විමර්ශනයක් පවත්වා ඇත. | ප්‍රමාදයකින් තොරව ලකුණු ලේඛන විභාග අංශයට භාරදීමට කටයුතු කළ යුතුය. |
| (iii) නාට්‍ය, මුද්‍රා නාට්‍ය හා නූතන නර්තන අධ්‍යයන අංශයේ 2016/2017 අධ්‍යයන වර්ෂයට අයත් විෂයයන් 3 ක අදාළ අධ්‍යයන වර්ෂය 2019 ජුනි 18 වන දිනෙන් අවසන් වීමෙන් පසු දින 127 කටත් වඩා ප්‍රමාද කර ප්‍රායෝගික පරීක්ෂණ පවත්වා තිබූ බව නිරීක්ෂණය විය. | මූලික පරීක්ෂණයක් පවත්වා ඇත. | ප්‍රමාදවීමකින් තොරව ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්විය යුතුය. |

**3.3 අරමුදල් ඌන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නිලධාරීන්ගේ බාහිර විෂය ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම සඳහා (Encourage Extra Curricular Activities) 2017 වර්ෂයේදී ලැබී තිබුණු රු.403,500 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ඌන උපයෝජිතව පැවතුණි. | නිතර උපකුලපතිවරුන් වෙනස්වීම නිසා ශරීරසුවතා මධ්‍යස්ථානය ආරම්භ කිරීම ප්‍රමාදවී ඇති බව දන්වා ඇත. | අදාළ කාර්යය ඉටු කර ගැනීම වෙනුවෙන් අරමුදල් වැය කළ යුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 590 දෙනෙකු වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 465 දෙනෙකු වූයෙන් පුරප්පාඩු 125 ක් විය. අධ්‍යයන කාර්යමණ්ඩලයේ පුරප්පාඩු 90 ක් පැවතීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී බාහිර කථිකාචාර්ය දීමනා වෙනුවෙන් රු.44,059,344 ක් ගෙවා තිබුණි. | අනධ්‍යයන වැඩවර්ජන, මැතිවරණ, පාලකසභා විසුරුවීම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සියළු බඳවා ගැනීම් අත්හිටුවීම් වැනි කරුණු මත බඳවා ගැනීම් ප්‍රමාද වී ඇත. | කඩිනමින් පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |

**4 ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉලක්ක 08 කට අදාළව ක්‍රියාකාරකම් 153 ක් ඇතුළත්ව තිබුණ ද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ක්‍රියාකාරකම්වලින් සියයට 54 ක් අවසන් කර නොතිබුණි. | ඉලක්ක සපුරා ගැනීමේදී විවිධ අභියෝගවලට මුහුණදීමට සිදු විය. | ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4.2 අයවැය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පුනරාවර්තන අයිතම දෙකක මුළු ප්‍රතිපාදනය වූ රු.750,000 ක් මුළුමනින්ම උපයෝජනය කර නොතිබුණි. | පාස්කු ප්‍රහාරය සහ අනධ්‍යයන කාර්යමණ්ඩල වැඩවර්ජන හේතුවෙන් සැලසුම්කළ පරිදි වියදම් දැරීම සීමා වී ඇත.. | අයවැය විචලතාවයන් හැකිතාක් අවම කර ගැනීමට කටයුතු කළ යුතු අතර ප්‍රතිපාදන ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය. |
| (ආ) විශ්වවිද්‍යාලයේ අයවැයගත වියදම් සමඟ තත්‍ය වියදම් සැසඳීමේ දී ප්‍රාග්ධන වියදම් අයිතම 7 ක සහ පුනරාවර්තන වියදම් 6 ක අයවැයගත වියදම හා තත්‍ය වියදම අතර සියයට 25 සිට සියයට 95 අතර විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොමැති බව විගණනයට නිරීක්ෂණය විය. | පාස්කු ප්‍රහාරය සහ ප්‍රතිපාදන නිදහස් නොකිරීම වැනි හේතු මත වියදම් කළ වටිනාකම අඩුවී ඇති අතර එම අර්බුදකාරී තත්ත්වයන් නිසා අවශ්‍යතාවයන්හි ප්‍රමුඛතා වෙනස් කිරීමට සිදුවූ නිසාවෙන් සමහර වියදම් ප්‍රතිපාදන ඉක්මවා ඇත. | අයවැය විචලතාවයන් හැකිතාක් අවම කර ගැනීමට කටයුතු කළ යුතු අතර ප්‍රතිපාදන ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය. |